# පිටබැද්දර ප්‍රාදේශීය සභාව
# මාතර දිස්ත්‍රික්කය
---------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 31 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මැයි 02 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට පිටබැද්දර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයෙන් සභාව වෙත ලැබී තිබූ රු.106,500 ක් වටිනා ශබ්ද විකාශන උපකරණ තුනක වටිනාකම ගිණුම් වලින් අත්හැරී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට බැංකු ගිණුම් තුනකට අදාල බැංකු සැසඳුම් අනුව අතඉතිරි මුදල් ප්‍රමාණය රු.86,578 ක් වුවද එය මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරී තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය අවසානයට ජල ගබඩා තොග ශේෂයට අයත් භාණ්ඩ වර්ග 47 ක වටිනාකම ගණනය කර අත ඉතිරි තොගය ලෙස නොපෙන්වීම නිසා එම අගයෙන් අවසන් තොගය අඩුවෙන් දැක්විණි.

(ඈ) ප්‍රා.ස. 7 ණයගැති වාර්තාව අනුව අක්කර බදු, ජල ගාස්තු හා බදුකුලී වටිනාකම රු.2,262,914 ක් වුවද එම අගය සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු.2,756,158 ක් ලෙස දැක්වීම නිසා ණයගැති වටිනාකම රු.493,244 ක් අධිගණනය වී තිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් ලේඛනය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.28,003,340 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල රු.30,227.850 ක් ලෙසට ගිණුම්ගත කර තිබුනෙන් එකී වටිනාකම රු.2,224,510 කින් වැඩියෙන් පෙන්නුම් කෙරිණි.

(ඊ) සේවක ඇප ලේඛනය අනුව නිලධාරීන් හා සේවකයින් 20 දෙනෙකුගේ ඇප තැන්පත් වටිනාකම රු.101,462 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එය රු.53,604 ක් පමණක් වූයෙන් අඩුවෙන් ගිණුම්ගත වී තිබූ මුදල රු.47,858 ක් විය.

#### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 11 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.97,192,391 ක් වූ අතර උපයෝගී ලේඛන/උපලේඛන අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.98,705,922 ක් වූයෙන් වෙනස රු.1,513,531 ක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

ඉකුත් වර්ෂයේ සිට ජංගම බැරකම් යටතේ දක්වා තිබූ රු.4,392 ක්වූ අවිනිශ්චිත ගිණුමේ ශේෂය හඳුනාගෙන නිරවුල් කිරීමට සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

1.3.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ලැබිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.99,851,464 ක් විය.

(ආ) 2014 දෙසැම්බර් 31 දිනට අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.91,422,476 ක් විය.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.30,227,850 ක් වූ වත්කම් සම්බන්ධ සමීක්ෂණ මණ්ඩල වාර්තා හා රු.2,428,618 ක් වූ වගකීම් හා රු.1,496,936 ක් වූ ආදායම් සම්බන්ධ උපලේඛන විගණනයට ඉදිරිපත් නොවීය.

1.3.6 නීති, රීති , හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති, රෙගුලාසිවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | |
| (ii) රීති 193 | අයවැයගත හා පරිපූරක සම්මත වැය සමග වැය විෂයයන්හි තථ්‍ය වියදම් සසඳා අතිරික්ත හා ඌනතා පිළිබඳ හේතු දැක්වෙන ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) රීති 218 | පරීක්ෂණ මණ්ඩලයක් මගින් සභාව ප්‍රයෝජනයට ගනු ලබන හා පදිංචියට ගනු ලබන සියළු ඉඩම් හා ගොඩනැගිලි සෑම වර්ෂයකට වරක් හෝ පරීක්ෂා කිරීමට සභාපතිවරයා විසින් කටයුතු කළයුතු වුවද එසේ කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඑ්අයි 2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිඝනක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.6,897,611 ක් වූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,470,127 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයයන් | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,101 | 914 | 217 |
| කුලී | 5,312 | 4,003 | 1,202 |
| බලපත්‍ර ගාස්තු | 605 | 218 | 70 |
| වෙනත් ආදායම් | 6,565 | 8,354 | 98,124 |

2.2.2 අක්කර බදු

2014 ජනවාරි 01 දිනට අක්කර බදු හිඟ ශේෂය රු.203,738 ක් වූ අතර වර්ෂය සඳහා රු.31,035 ක බිල්කිරීම් සමඟ අයවිය යුතු මුදල රු.234,773 කි. බිල්කළ මුදලින් හා හිඟ මුදලින් සමාලෝචිත වර්ෂයේදී රු.18,427 ක් අයකරගෙන තිබූ අතර අයවීමේ ප්‍රතිශතය සියයට 7.8 ක් තරම් සුළු අගයක් ගෙන තිබුණි.

2.2.3 බදු කුලී

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත බදු කුලී අගය රු.5,312,000 ක් වූ අතර ගිණුම් වර්ෂය අවසාන දිනට හිඟ මුදල රු.1,202,755 ක් වූයෙන් එය ඇස්තමේන්තුගත මුදලින් සියයට 22 ක් විය.

2.2.4 බලපත්‍ර ගාස්තු

ඉකුත් වර්ෂ කිහිපයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.70,522 ක හිඟ වෙළඳ බලපත්‍ර ගාස්තු මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.5 වෙනත් ආදායම්

වෙනත් ආදායම් ණයගැති ශේෂය රු.98,124,676 ක් වී තිබුණි.

2.2.6 ජල ගාස්තු

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචි නිවැසියන්ට හා විවිධ ආයතන වෙත ප්‍රාදේශීය සභාව මගින් ජල සැපයුම ලබාදී තිබූ අතර එසේ ජල සැපයුම් ලබා දුන් ජල පාරිභෝගිකයින් නිසි පරිදි බිල්පත් නිරවුල් නොකිරීම නිසා 2014 දෙසැම්බර් මස 31 දින වන විටද පාරිභෝගිකයින් 129 දෙදෙනෙකුගේ ජල සම්බන්ධතා විසන්ධි කර තිබූ අතර එකී පාරිභෝකයින්ගෙන් අයවීමට තිබූ මුදල රු.572,697 ක් විය.

(ආ) 2014 ජනවාරි 01 දිනට හිඟහිටි ජල ගාස්තු රු.982,520 ක් වූ අතර වර්ෂය සඳහා රු.877,093 ක බිල් කිරීම් සමඟ අයවිය යුතු මුදල රු.1,859,613 ක් විය. බිල්කළ මුදලින් හා හිඟ මුදලින් රු.1,103,554 ක් අයකර ගෙන තිබූ අතර අයවීමේ ප්‍රගතිය සියයට 59 ක් විය.

2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතුව තිබූ උසාවි දඩ හා මුද්දර ගාස්තු මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| උසාවි දඩ | 2,586,117 |
| මුද්දර ගාස්තු | 6,747,225 |

2.2.8 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු ගාස්තු

සභා බල ප්‍රදේශයේ 2007, 2009, 2010 හා 2011 වර්ෂවල දුරකථන සම්ප්‍රේෂන කුළුණු 07 ක් ඉදිකර ඇතත් එකී කුළුණු වලින් ගාස්තු අය කිරීමට අතුරු ව්‍යවස්ථා පනවා නොමැති අතර ඒ හේතුවෙන් සභා අරමුදලට අයවිය යුතු ආදායම් අහිමි වී තිබුණි.

2.2.9 කඩ කාමර බදු

සභාව සතු කඩ කාමර වලින් කුලි අයවීම ඉතා දුර්වල තත්ත්වයක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානයට වූ හිඟ මුදල 2015 ජුලි 22 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබූ අතර එම මුදල රු.318,910 ක් විය.

2.2.10 වරිපනම් බදු

2010 පෙබරවාරි මස 08 වන දින අංක 1641/41 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 04 ක් නාගරික සංවර්ධන අධිකාරී පනත ප්‍රකාරව දියුණු ප්‍රදේශ ලෙස ප්‍රකාශ කර තිබුණද එම ප්‍රදේශවල වරිපනම් බදු අය කිරීමට අදාල ඉදිරි කටයුතු ප්‍රාදේශීය සභාව විසින් ඉටු නොකිරීම හේතුවෙන් 2010 පෙබරවාරි මස සිට 2014 දෙසැම්බර් මස 31 වන දින වන විට එනම් වසර 05 ක පමණ කාලයක වරිපනම් බදු ආදායමක් සභාවට අහිමිවී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

2005 මාර්තු 31 දිනැති අංක 08/2005 දරන රාජ්‍ය පරිපාලන ලේකම්ගේ චක්‍රලේඛයේ 11.5 වගන්තිය අනුව දේපළ ණය සඳහා බැංකු පොලී අනුපාතය හා නිලධාරියාගෙන් අයකරන සියයට 4.2 ක පොලී අනුපාතය අතර වෙනස රජය විසින් ප්‍රතිපූර්ණය කළ යුතුය. එසේ වුවද 2014 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූර්ණය නොවූ මුදල රු.239,645 ක් විය.

3.2 වත්කම් කළමනාකරණය

(අ) සභාවට අයත් මොරවක, පිටබැද්දර හා කළුබෝවිටියන පුස්තකාල පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ වාර්තාව පරිදි පුස්තකාලවල රු.102,400 ක් වටිනා පුස්තකාල පොත් 96 ක් සමීක්ෂණයට ඉදිරිපත්ව නොතිබූ අතර ඊට වගකිව යුතු තැනැත්තන් සම්බන්ධයෙන් ගත යුතු නීතිමය පියවර ගෙන නොතිබුණි.

(ආ) සභාවේ ප්‍රධාන කාර්යාල, උප කාර්යාලය, ආයුර්වේද බෙහෙත් ශාලාව, පුස්තකාල, පෙර පාසැල් වල ඉන්වෙන්ට්‍රි භාණ්ඩ පිළිබඳව 2014 දෙසැම්බර් 31 දිනට සමීක්ෂණ වාර්තාව අනුව නිරීක්ෂණය වූ ඌනතා හා අතිරික්තයන් සම්බන්ධයෙන් සුදුසු කටයුතු කර නොතිබුණි.

3.3 මානව සම්පත් කළමනාකරණය

2013 දෙසැම්බර් 31 දිනට සභාවේ සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|
| විධායක | 02 | 01 | 01 | |
| ද්විතියික | 21 | 18 | 03 | |
| ප්‍රාථමික | 30 | 26 | 04 | |
| වෙනත් (අනියම්,තාවකාලික, කොන්ත්‍රාත්) | - | 05 | - | 05 |
| | 53 | 50 | 08 | 05 |

සමාලෝචිත වර්ෂයේ පළාත් පාලන කොමසාරිස් වෙතින් කාර්යය මණ්ඩල වැටුප් හා මන්ත්‍රී දීමනා ලෙස රු.13,214,315 ක් මුදලක් ප්‍රතිපූර්ණය කර තිබූ අතර වර්ෂය තුල කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස රු.17,983,221 ක මුදලක් වැයකර තිබුණෙන් සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලට රු.4,768,906 ක අතිරේක වැය බරක් වී තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ 2005 නොවැම්බර් 08 දිනැති අංක 03 දරන පළාත්පාලන ප්‍රතිසංස්කරණ චක්‍රලේඛයේ 8 ඡේදය පරිදි අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටු

සභාව විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි

4.3 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර ඇති අයවැය ලේඛනය අනුව වූ ඇස්තමේන්තුගත ආදායම් හා වියදම් වර්ෂයේ තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් හා වියදම් සම්බන්ධ සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වන බැවින් අයවැය ලේඛනය සඵල මූල්‍ය පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනය

පහත දැක්වෙන පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) මූල්‍ය පාලනය
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) වත්කම් කළමනාකරණය